ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

# ශෝක පණිවුඩය

ජැක්සන් ඇන්තනීලාගේ කලා පරම්පරාවේ පුරෝගාමියකු වූ සරත්චන්ද්‍රයන් ගේ "මළගිය ඇත්තෝ" කෘතියේ මෙසේ සඳහන් ය.

"ලොව ඇත්තේ යාම් ඊම් ය. නැවිත් යන්ට බැරි ය. නොගොස් එන්න බැරි ය."

ලොව වෙසෙන අප සියල්ල ම මේ සත්‍යයට යටත් ය. කවදා හෝ අපට යන්නට සිදු වෙයි.

බහු විධ කලා නිපුණයකු වූ ජැක්සන් ට ද අප අතැර යන්නට කාලය එළැඹ ඇත. නමුදු මේ තරම් ඉක්මණින් ඔහු යතැයි අප කිසිවකු සිතුයේ නැත.

ඔහුගේ නික්මීම ලාංකේය නිර්මාණ ක්ෂේත්‍රයට සිදු වූ අතිමහත් පාඩුවක් සේ මම දකිමි.

පසුගිය දින කීපය පුරා බොහෝ දෙනෙක් ජැක්සන් ගේ නිර්මාණ භූමිකාව ගැන අදහස් දැක්වූහ. එහිදී අතපසු වූ එක් කරුණක් පිළිබඳව විශේෂ අවධාරණයක් කිරීමට මම කැමැත්තෙමි. ඒ ඔහු නවකතාකරුවකු ලෙස දැක්වූ ප්‍රතිභාවයි.

" කන්ද උඩ ගින්දර " ජැක්සන් ලියූ මුල් ම නව කථාව යි. එහි දෙවන කොටස ලියන්නට ජැක්සන් සූදානමින් සිටි බව මම දනිමි. නමුත් එය අවසන් කර ගන්නට කලින් ඔහුගේ ජීවිතය අවසන් විය. එය ද කණගාටුවට කරුණකි.

ඔහුගේ අභාවය පිළිබඳව මගේත්, මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මහත්මියගේත් සංවේගය පවුලේ සියළු සාමාජිකයන් හා නෑදෑ හිතමිතුරන් වෙත මෙසේ පිරිනමමි.

අවසාන වශයෙන් තවත් කරුණක් සඳහන් කළ යුතු ය .

ජැක්සන් ගේ ජීවිතයේ යම් යම් භාවිතාවන් තියුණු විවේචනයන්ට බඳුන් වූ අවස්ථා තිබිණි.

ඒ වගත් සිහිපත් කරමින්, ඔහු අනුදත් ධර්මයට අනුව බයිබලයේ එන මේ වැකි කීපය උපුටා දක්වනු කැමැත්තෙමි.

"විනිශ්චය නොකරන්න; එවිට ඔබ ද විනිශ්චය කරනු නොලබන්නෙහි ය. ඔබ දෙන විනිශ්චයෙන් ම ඔබත් විනිශ්චය කරනු ලබන්නෙහි ය. ඔබ මනින මිම්මෙන් ම ඔබටත් මැන දෙනු ලැබේ." (බයිබලය - නව ගිවිසුම)

බහු විධ කලා කුසලතාවන්ගෙන් සපිරි ජැක්සන් ඇන්තනීට මෝක්ෂ සුවය ලැබේවා.

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති

2023 ඔක්තෝබර් මස 11 වන දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka